## මූලික මාර්ගෝපදේශය

# බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පිළිබඳ පනත් කෙටුම්පත

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
2017 මැයි

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම්කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථනː +9411 2081384, + 9411 2081385 +94112081386
ෆැක්ස් ː +9411 2081388,
ඊමේල්ː info@cpalanka.org
වෙබ්ː www.cpalanka.org
ෆේස්බුක්ː www.facebook.com/cpasl
ට්විටර්ː @cpasl

**පසුබිම**

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ප්‍රශ්නය දශක ගණනාවක් පුරා වාර්ගික බෙදීම හරහා ශ්‍රී ලාංකිකයන්ට බලපෑම් සිදු කරන ලදි. 1970 සහ 80 යන කාල වකවානුවේ "ආණ්ඩු විරෝධී තරුණ කැරලි" අතරතුරදී සහ දීර්ඝ කාලීනව පැවති සන්නද්ධ ගැටුම් අතරතුරදී රජය හා රාජ්‍ය නොවන පාර්ශ්ව විසින් සිදුකලේ යැයි සැක කරණ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පුළුල් ලෙස වාර්තා වී ඇත. මෙම සිදුවීම් විමර්ශනය කිරීම සඳහා අනුප්‍රාප්තික රජයන් විසින් පරීක්ෂණ කොමිසම් කීපයක්ම පත් කළද දහස් ගණනකගේ ඉරණම තවමත් නොදන්නා කරුණකි. එවැනි පරීක්ෂණ කොමිසම් කීපයක්ම නිර්දේශ කරන ලද්දේ බලහත්කාරීව හෝ ස්වේච්ඡාවෙන් තොරව සිදු වූ අතුරුදහන් කිරීම් පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණයට නීති සංශෝධන ඉදිරිපත් කිරීම හා අනාගතයේදී මෙවන් වූ සංසිද්ධීන් තුරන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවයි. මෙම සවිස්තරාත්මක නිර්දේශවලින් සැළකිය යුතු බහුතරයක් දශක ගණනාවක් යනතුරුත් ක්‍රියාවට නැංවී නොමැත.

"මෙම ප්‍රශ්නය පුළුල්ව ආමන්ත්‍රණය කිරීමට හා අනාගතයේදී මෙවන් වූ සංසිද්ධීන් තුරන් කිරීමටත් එසේම පවත්නා හිඩැස් පිරවීමටත්, කොමිසම තරයේ නිර්දේශ කර සිටින්නේ දේශීය ව්‍යවස්ථාවක් පැනවීම මඟින් විශේෂයෙන්ම බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් තොරව අතුරුදහන් කිරීම් අපරාධකරණය කළ යුතු බවයි."
**උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ පරීක්ෂණ කොමිසම් වාර්තාව**
2011 (5.46)

2015 දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකාව විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර (ICPPED) සම්මුතිය අත්සන් කළ අතර එය 2016 මැයි මසදී අපරානුමත කරන ලදි. මෙම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට ශ්‍රී ලංකාව තුළ නෛතික වලංගුභාවය ලබා දීම සඳහා, ශ්‍රී ලංකා රජය විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියපිළිබඳ පනත් කෙටුම්පත හඳුන්වා දුන් අතර එය 2017 පෙබරවාරි 09 වන දින ගැසට් පත්‍රයේ පළ වී පසුව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට අන්තර්ගත විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන මෙම මූලික මාර්ගෝපදේශය හරහා යෝජිත පනත පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම අපේක්ෂිතය. නීති නිර්මාණය කිරීමේ ක්‍රියාපටිපාටියේ ඊළඟ අදියර ලෙස කාරක සභා අවස්ථා විවාදයේදී සංශෝධන සඳහා මෙම පනත් කෙටුම්පත විවෘත වනු ඇත. මෙම මූලික මාර්ගෝපදේශය මඟින් මේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධ අයවලුන් හා අනෙක් පාර්ශ්වකරුවන්ව වත්මන්ව යෝජනා කර ඇත්තේ කුමක්ද යන්න පිළිබඳව දැනුම්වත් කෙරේ.

පනත පැනවීමෙන් පසු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම මූලික මාර්ගෝපදේශය යාවත් කාලීන කරමින් නව පනත පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කරන බවට සහතික වේ.

**මෙම පනත් කෙටුම්පතින් සිදු කරන්නේ කුමක්ද?**

1. ”බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්” වරද හා ඊට අනුයාත වෙනත් වැරදි නිර්වචනය කිරීම.
2. අතුරුදහන් වූ පුද්ගලයන්, නිදහස අහිමි කළ පුද්ගලයන්, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්ට හා නීතිඥයන්ට, මෙ පනතේ සඳහන් වැරදි යටතේ අත් අඩංගුවට ගත් පුරවැසියන් නොවන පුද්ගලයන්ට නව අයිතිවාසිකම් ස්ථාපිත කිරීම.
3. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ වරද සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නඩු පැවරීමට වෙනත් රාජ්‍යන් සමඟ අන්‍යෝන්‍ය නෛතික සහයෝගී වැඩපිළිවෙලක් සැපයීම.

**පනත් කෙටුම්පතේ ”බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම” නිර්වචනය කරන්නේ කෙසේද?**

| | බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම | | |
|---|---|---|---|
| | 3(1) වගන්තිය | 3(2) වගන්තිය | 3(3) වගන්තිය |
| කවුද | යම් තැනැත්තකු රජයේ නිලධරයකු වශයෙන් සිටිමින් හෝ රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරමින් හෝ රජයේ බලය පැවරීම, සහාය සහ අනුදැනුම ඇතිව ක්‍රියාකරමින් | යම් තැනැත්තකු | 3 (1) වගන්තියේ සඳහන් පුද්ගලයකුගේ ප්‍රධානියකු. |
| කුමක් සිදුකරන්නේද | වෙනත් යම් තැනැත්තකු සිරභාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; **සහ**<br><br>(i) එම සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම, අයුතු ලෙස සිරකර තබා ගැනීම, පැහැර ගෙනයාම, අපහරණය කිරීම හෝ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරන; හෝ<br>(ii) එවැනි වෙනත් යම් තැනැත්තකුගේ ඉරණම සඟවන; හෝ<br>(iii) එකී වෙනත් යම් තැනැත්තකුගේ තදනන්තර හෝ වර්තමානයේ සිටින ස්ථානය හෙළිදරව් කිරීම | වෙනත් යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; **සහ**<br><br>(i) එම අයුතු ලෙස සිරකර තබා ගැනීම, පැහැර ගෙනයාම, අපහරණය කිරීම හෝ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරන; හෝ<br>(ii) එවැනි වෙනත් යම් තැනැත්තකුගේ ඉරණම සඟවන; හෝ<br>(iii) එකී වෙනත් යම් තැනැත්තකුගේ තදනන්තර හෝ වර්තමානයේ සිටින ස්ථානය හෙළිදරව් කිරීම | යම් ප්‍රධානයකුගේ අධිකාරී බලය යටතේ හෝ පාලනය යටතේ සිටින්නන් (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කරමින් සිටි බවට හෝ සිදු කිරීමට අත්‍යාසන්නව සිටි බවට පැහැදිලිව පෙන්නුම් කරන තොරතුරු දැන සිටි හෝ සිතාමතා නොසලකා හරිනු ලැබූ;<br><br>බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමේ වරද සිදු කිරීමෙහිලා හේතු සාධක වූ ක්‍රියාකාරකම් පාලනය කිරීමේ බලය සහ වගකීම දරනු ලැබූ; සහ<br><br>(1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු |

| | | | |
|---|---|---|---|
| | පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැතහොත් වලංග හේතුවක් නොමැතිව හෙළිදරව් කිරීම ට නොහැකි වන, | පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැතහොත් වලංග හේතුවක් නොමැතිව හෙළිදරව් කිරීම ට නොහැකි වන, | කිරීම වැළැක්වීම සඳහා හෝ යටපත් කිරීම සඳහා අවශ්‍ය හා සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වූ හො අවශ්‍ය වන අවස්ථාවක දී අදාළ කරුණ පිළිබඳව විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට එම කරුණ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබූ, |

**පනත් කෙටුම්පත නිදහස අහිමි කිරීම යන්න නිර්වචනය කරන්නේ කෙසේද?**

පනත් කෙටුම්පත නිදහස අහිමි කිරීම නිර්වචනය කරන්නේ "යම් තැනැත්තකු යම් විශේෂිත ස්ථානයක රඳවා තබා ගැනීම සම්බන්ධව එම තැනැත්තාගේ කැමැත්තෙන් තොරව එම තැනැත්තා එම විශේෂිත ස්ථානයේ රඳවා තබා ගැනීම අදහස් වේ" *[25 වගන්තිය]*

මීට අතිරේකව, පනත් කෙටුම්පත මගින් විශේෂ අවස්ථා කීපයක් දක්වයි, එනම්, අයුතු ලෙස සිරකර තබා ගැනීම, පැහැරගෙන යාම සහ අපහරණය කිරීමෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පුද්ගලයෙකුගේ නිදහස අහිමි කිරීමක් වේ. මෙම වගන්තියේ සඳහන් "අයුතු ලෙස සිරකර තබා ගැනීම", "පැහැරගෙන යාම" හා "අපහරණය" යන අර්ථ දණ්ඩ නීති සංග්‍රහයේ සමාන අර්ථයට ගැනේ. *[3(1) හා 3(2) වගන්ති]*

යම් තැනැත්තකු රජයේ නිලධරයකු වශයෙන් සිටිමින් හෝ රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරමින් හෝ රජයේ බලය පැවරීම, සහාය සහ අනුදැනුම ඇතිව ක්‍රියාකරමින් වෙනත් යම් තැනැත්තකු සිරභාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන සහ (i) (ii) හෝ (iii) හි දක්වන පරිදි ක්‍රියාකරන යම් අයෙකු මෙම වරදට වැරදිකරු වන බවයි. *[3(1) වගන්තිය]*

**පනත් කෙටුම්පත නිර්වචනය කර ඇති අනෙක් වැරදි මොනවාද?**

1. 3 වන වගන්තියේ දක්වා ඇති වරදක් සිදු කිරීමට අධාර කරනු ලබන හෝ අනුබල දෙනු ලබන හෝ 3 වන වගන්තියේ දක්වා ඇති වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරනු ලබන හෝ තැත් කරනු ලබන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වේ" *[4 වගන්තිය]*

   'අනුබල දීම' හා 'කුමන්ත්‍රණය' යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ ඇති සමාන අර්ථයම යෙදේ. මෙම වැරදි සඳහා වන දඬුවම් ද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සඳහා වන දඬුවම්ම වේ.

2. මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ වූ වරදක් සිදු කළ බවට සැක කරනු ලබන්නා වූ තැනැත්තකු ද ඇතුළුව පහත දැක්වෙන වැරදි සඳහා වරදකරු/කාරිය විය යුතුය. *[17 වගන්තිය]*
    - යම් විමර්ශනයක් පැවැත්වීමේ දී ඊට මැදිහත් වන
    - ඉලක්ක කොට තර්ජනය කිරීමෙන් හෝ බැනවැදීමෙන් හෝ පීඩනයක් එල්ල කිරීමෙන් විමර්ශනයේ ප්‍රගතියට බලපෑම් කරන,
        - ❖ පැමිණිලිකරු
        - ❖ සාක්ෂිකරුවන්
        - ❖ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්
        - ❖ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ නීතිඥයින්
        - ❖ විමර්ශනයට සහභාගීවන පුද්ගලයන්

3. නිල රෙජිස්ටරය සඳහා වගකිව යුතු නිලධරයා ඔහු/ඇය විසින් පහත පරිදි වරදක් සිදු කළ හොත් වරදකරු විය යුතුය *[17 වගන්තිය]*
    - යම් තැනැත්තකුගේ නිදහස අහිමිවීම වාර්තාගත කිරීම ඕනෑකමින් පැහැර හරින හෝ සාවද්‍ය බව ඔහු විසින් දැන සිටින යම් තොරතුරක් වාර්තාගත කරන;
    - යම් තැනැත්තකුගේ නිදහස අහිමිවීම පිළිබඳ තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් වූ නීතිමය නියමයන් සපුරා තිබිය දී එය නොතකා එම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන හෝ සාවද්‍ය තොරතුරු ලබාදෙන

**වැරදිවල ස්වභාවය [5 වගන්තිය]**

මේ පනත යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥේය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

**වැරදි සඳහා අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයටද? [5 වගන්තිය]**

මෙම පනත් කෙටුම්පත යටතේ ඇති වැරදි සඳහා පහත අවස්ථාවන්වලදී මහාධිකරණයට අධිකරණ බලය පවතී.
1. එය සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාව තුළදී වීම
2. එය ශ්‍රී ලංකාවෙන් පිටතදී සිදු කරන ලද්දේ නම්,

- වරදකරු (ඔහුගේ/ඇයගේ පුරවැසිභාවය නොසළකා) ශ්‍රී ලංකාවේ අධිකරණ බල සීමාව තුළ පිහිටි යම් ප්‍රදේශයක සිටින්නේ නම්.
- වරදකරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් හෝ ඔහු සම්මුතියට පාර්ශ්වකරුවකු වන වෙනත් රාජ්‍යයක පුරවැසියකු නම් හෝ ශ්‍රී ලංකාවේ සිරිතක් ලෙස පදිංචි වී සිටින රටක් නොමැති තැනැත්තකු නම්;
- එම ක්‍රියාව සිදු කරන ලද්දේ
    - ❖ ශ්‍රී ලංකාවේ ධජය යටතේ යාත්‍රාකරන නැවකට; හෝ
    - ❖ වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ ගුවන් යානයකට, එරෙහිව නම් හෝ එවැන්නක් ඇතුළත නම්;

- වරද සිදු කරනු ලැබූ බව කියනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද එම තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම්

**පනත් කෙටුම්පතින් ආරක්ෂා කරන්නාවූ පුද්ගල කාණ්ඩ කවරේද?**

මෙම පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්ම විවිධ පුද්ගල කණ්ඩායම්වලට එනම්, අතුරුදහන් වූ පුද්ගලයින්, නිදහස අහිමි කළ පුද්ගලයින්, මෙම පනත් කෙටුම්පතේ සඳහන් වැරදි යටතේ අත් අඩංගුවට ගත් පුරවැසියන් නොවන පුද්ගලයින් හා අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන් හා නීතිඥයින් සඳහා අයිතිවාසිකම් ලබා දේ.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් හි වින්දිතයන්**

1. වින්දිතයෙක් යනු කවුද?
    - අතුරුදහන් වූ පුද්ගලයා
    - බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදු වී ඇති පුද්ගලයෙක් *[25 වගන්තිය]*

2. වින්දිතයෙකුගේ අයිතිවාසිකම් කවරේද?
    - බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් පිළිබඳ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් වූ සත්‍ය තත්ත්වය පිළිබඳව දැන ගැනීමට.
    - නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් පවත්වනු ලබන විමර්ශනවල ප්‍රගතිය සහ එහි ප්‍රතිඵල පිළිබඳව දැන ගැනීමට.
    - අතුරුදහන් වූ තැනැත්තාගේ ඉරණම පිළිබඳව දැන ගැනීමට.
    - අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඉරණම කුමක් ද යන්න ස්ථාපිත කර ගැනීමට උත්සාහ කිරීම අරමුණු කොට ගත් සංවිධාන හා සංගම් නිදහසේ පිහිටුවා ඒවාට සහභාගීවීමේ අයිතිය සහ 3 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වින්දිතයකු වූ තැනැත්තකුට නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන්ගේ සහාය ලබා ගැනීමේ අයිතිය ද සෑම වින්දිතයකුට ම හෝ වින්දිතයකුගේ ඥාතියකුට ම නීතිය මඟින් නියම කර ඇති සීමාවන්ට යටත්ව තිබිය යුතු ය. *[14 වගන්තිය]*
    - අතුරුදහන් වූ පුද්ගලයා සෙවීම සඳහා එක් රැස් කරගත් දත්තවල ආරක්ෂාව හා පෞද්ගලිකත්වයේ අයිතිය. *[19 වගන්තිය]*

අතුරුදහන් වූ පුද්ගලයා සෙවීම සඳහ එක් රැස් කළ හෝ සම්ප්‍රේෂණය කළ වෛද්‍ය හා ජානමය දත්ත ඇතුළු පෞද්ගලික තොරතුරු;

- ❖ අතුරුදහන් වූ පුද්ගලයා සෙවීමේ අරමුණට මිස භාවිත කර හෝ ලබා ගැනීමට ඉඩ සැළසීම නොකළ යුතුය.
- ❖ පුද්ගලයෙකුගේ ගරුත්වය හෝ මූලික අයිතිවාසිකම් හා නිදහස උල්ලංඝණය කිරීමට තුඩු දිය හැකි හා තුඩු දෙන එකතු කරන ලද, සකස් කරන ලද, භාවිත කරන ලද හෝ ගබඩා කරන ලද තොරතුරු ලබා නොදිය යුතුය.

කෙසේ වෙතත්, මෙකී තොරතුරු මෙම පනත් කෙටුම්පත යටතේ අදාළ වැරදි සම්බන්ධ අපරාධ නඩුකටයුතුවලදී හා වන්දි ලබා ගැනීම සඳහා ඇති අයිතිය ක්‍රියාවේ යෙදවීමේදී භාවිත කිරීම නොවළක්වනු ඇත.

නීති නීති ක්‍රියාත්මක කිරීමේ බලධරයන් සතු කාර්යයන් කවරේද?

- විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති විටකදී වුවද, 3 වන වගන්තිය යටතේ දක්වන වරදකට යම් පුද්ගලයයෙක් භාජනය වී ඇති බවට සාධාරණ පදනම් මත විශ්වාස කළ හැකි විටකදී ඒ සම්බන්ධව විමර්ශන පැවැත්වීම.
- අතුරුදහන් වූ පුද්ගලයා හා සිටින ස්ථානය සොයා ගැනීමට අවශ්‍ය අදාළ සියලු පියවර ගැනීම.
- රහස් ස්ථානයක රඳවා තබාගෙන සිටින තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තැනැත්තා මුදා ගැනීම සඳහා පියවර ගත යුතු ය.
- අතුරුදහන් වූ තැනැත්තා මියගොස් ඇති අවස්ථාවක එම තැනැත්තාගේ දේහය සොයා ගෙන ඊට ගෞරව දක්වා එය ආපසු භාරදීම සඳහා කටයුතු කළ යුතු ය.

පනත් කෙටුම්පත 'නීති ක්‍රියාත්මක කිරීමේ බලධරයන්' යන්න නිර්වචනය කරනුයේ පොලිස් නිලධරයකු හෝ යම් වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීමට යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ බලය පවරා ඇති යම් තැනැත්තකු හෝ ආයතනයක් අදහස් වේ.

**නිදහස අහිමි කළ පුද්ගලයින්** [15 වගන්තිය]

1. නිදහස අහිමි කළ පුද්ගලයෙකු යනු

යම් තැනැත්තකු යම් විශේෂිත ස්ථානයක රඳවා තබා ගැනීම සම්බන්ධව එම තැනැත්තාගේ කැමැත්තෙන් තොරව එම තැනැත්තා එම විශේෂිත ස්ථානයේ රඳවා තබා ගැනීම අදහස් වේ *[25 වගන්තිය]*

2. නිදහස අහිමි කළ පුද්ගලයෙක් සතු අයිතීන් කවරේද?

- කිසිම පුද්ගලයෙකු රහසිගතව රඳවා තබා ගැනීමක් නොකළ යුතුය.

"රහසේ රඳවා තබා ගැනීම" යන්නෙන් යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ බලයලත් රඳවා තබා ගැනීමේ ස්ථානයක් නොවන ස්ථානයක තැනැත්තකු රඳවා තබා ගැනීම සහ එම තැනැත්තා සිටින ස්ථානය හෝ ඔහුගේ ඉරණම එම තැනැත්තාගේ ඥාතීන් හෝ වෙනත් තැනැත්තන් නොදන්නා අවස්ථානුගත කරුණු අදහස් වේ. *[25 වගන්තිය]*

නීතියේ සඳහන් කොන්දේසීන්ට යටත්ව නිදහස අහිමි කරන ලද ඕනෑම පුද්ගලයෙකුට ඔහුගේ/ඇයගේ ඥාතීන්ට,නීතිඥයෙකු හෝ ඔහු/ඇය කැමති වෙනත් ඕනෑම පුද්ගලයෙකුට, සන්නිවේදනය කිරීමට හා ඔහු/ඇය දැක ගැනීමට පැමිණීමට අයිතියක් ඇත.

3. නීති ක්‍රියාත්මක කිරීමේ බලධරය්න් සතු කාර්යයන් කවරේද?

- ශ්‍රී ලංකා මාන්ව හිමිකම් කොමිසමට හා නීති ක්‍රියාත්මක කිරීමේ බලධරයින්ට නිදහස අහිමි කළ පුද්ගලයින් සිටිනා ස්ථාන වෙත ප්‍රවේශය ලබා දිය යුතුය.

- නිදහස අහිමි කළ පුද්ගලයින් සම්බන්ධයෙන් යාවත්කාලීනව පවතින නිල රෙජිස්ටරයක් හා වාර්තාවන් නීති ක්‍රියාත්මක කිරීමේ බලධරයින් සම්පිණ්ඩණය කළ යුතුය.

  මෙකී රෙජිස්ටරය හා වාර්තාවන් ඕනෑම අධිකරණමය හෝ නීතිය මඟින් ඒ සඳහා බලය ලබා දී ඇති බලධාරී අධිකාරියකට හෝ ආයතනයක ඉල්ලීම මත එහි තොරතුරු විගස ලබා දීමට කටයුතු කළ යුතුය.

- මෙකී රෙජිස්ටර හෝ වාර්තා තුළ පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.
  - ❖ නිදහස අහිමි වූ තැනැත්තාගේ අනන්‍යතාවය;
  - ❖ යම් තැනැත්තකුගේ නිදහස අහිමි කළ සහ නිදහස අහිමි කළ දිනය, වේලාව සහ ස්ථානය;
  - ❖ එම තැනැත්තාගේ නිදහස අහිමි කළ අධිකාරියේ අනන්‍යතාවය;
  - ❖ නිදහස අහිමි කිරීමට අණ දුන් අධිකාරිය සහ නිදහස අහිමි කිරීමට හේතු;
  - ❖ නිදහස අහිමි කිරීම අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;
  - ❖ නිදහස අහිමි කළ ස්ථානය, නිදහස අහිමි කළ ස්ථානයට ඇතුළු කළ දිනය හා වේලාව සහ නිදහස අහිමි කිරීමේ ස්ථානය සඳහා වගකිව යුතු අධිකාරිය;
  - ❖ නිදහස අහිමි කළ තැනැත්තාගේ සෞඛ්‍ය තත්ත්වයට අදාළ තොරතුරු;
  - ❖ නිදහස අහිමි කර තිබූ කාලය තුළ මරණය සිදු වී නම්, මරණය සිදු වූ අවස්ථාගත කරුණු සහ හේතුව සහ දේහයේ ගමනාන්තය;
  - ❖ නිදහස අහිමි වූ තැනැත්තා නිදහස් කළ හෝ වෙනත් නිදහස අහිමි කළ ස්ථානයකට මාරු කළ දිනය හා වේලාව, නිදහස අහිමි කළ තැනැත්තා මාරු කරනු ලැබූ නිදහස අහිමි කළ ස්ථානයේ ගමනාන්තය සහ මාරු කිරීමට වගකිව යුතු අධිකාරිය.

**නිදහස අහිමි කළ පුද්ගලයෙකුගේ ඥාතීන්, නියෝජිතයින් හා නීතිඥයින් [16(1) වගන්තිය]**

*1. නිදහස අහිමි කළ පුද්ගලයෙකුගේ ඥාතීන්, නියෝජිතයින් හා නීතිඥයින් සතු අයිතිවාසිකම් කවරේද?*

- පහත දැක්වෙන තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිය තිබිය යුතු යඃ

  - ❖ නිදහස අහිමි කළ යුතු බවට නියෝග කළ තැනැත්තා හෝ අධිකාරිය පිළිබඳ තොරතුරු;
  - ❖ යම් තැනැත්තකුගේ නිදහස අහිමි කළ දිනය, වේලාව සහ ස්ථානය සහ නිදහස අහිමි කළ ස්ථානයට ඇතුළත් කළ දිනය සහ වේලාව;
  - ❖ නිදහස අහිමි කිරීම, අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;
  - ❖ නිදහස අහිමි වූ තැනැත්තා සිටින ස්ථානය සහ එම තැනැත්තා නිදහස අහිමි කිරීමේ වෙනත් ස්ථානයකට මාරු කිරීමේ දී එම තැනැත්තා මාරු කළ ස්ථානය හා මාරු කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;
  - ❖ නිදහස් කළ දිනය, වේලාව සහ ස්ථානය;
  - ❖ නිදහස අහිමි වූ තැනැත්තාගේ සෞඛ්‍ය තත්ත්වයට අදාළ තොරතුරු;
  - ❖ නිදහස අහිමි කර තිබිය දී මරණය සිදු වූ විට, මරණය සිදු වූ අවස්ථානුගත කරුණු හා මරණයට හේතුව සහ දේහයේ ගමනාන්තය.

2. නිදහස අහිමි කිරීමේ නීත්‍යානුකූලභාවය සැළකිල්ලට නොගෙන නිදහස අහිමි කළ පුද්ගලයෙකුගේ ඥාතීන්, නියෝජිතයින් හා නීතිඥයින්ට ඉහත සඳහන් කළ තොරතුරු ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම සඳහා ක්ෂණික වූත්, කාර්යක්ෂම වූත් අධිකරණමය ප්‍රතිකර්මයක් සඳහා අයිතිය පැවතිය යුතුය. මෙකී ප්‍රතිකර්මය සඳහා ඇති අයිතිය කිසිඳු අවස්ථාවක අත්හිටුවීම හෝ සීමා කිරීම නොකළ යුතුය.

3. නිදහස අහිමි කරන ලද පුද්ගලයෙකුගේ ඕනෑම ඥාතියෙකු, නියෝජිතයෙකු හෝ නීතිඥවරයෙකු මෙන්ම ඒ පිළිබඳව විමර්ෂණ කටයුතු සඳහා සහභාගීවන පුද්ගලයෙකු යම් බිය ගැන්වීමක්, අනිසි ආකාරයෙන්

සැළකීමක් හෝ යම් තහනමකට ලක් කිරීමක්, නිදහස අහිමි කළ පුද්ගලයෙකු පිළිබඳ තොරතුරු සෙවීමක් කරන විටක නොකළ යුතුය.

**මෙම පනත් කෙටුම්පත හරහා අත් අඩංගුවට ගන්නා පුරවැසියන් නොවන පුද්ගලයින් [7 වගන්තිය]**

මේ පනත යටතේ වූ වරදක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාක දී

- එම තැනැත්තා පුරවැසියකු වන රාජ්‍යයේ හෝ එම තැනැත්තාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරයකට හිමිකම් ඇති රාජ්‍යයක ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ හෝ එම තැනැත්තා රටක් නොමැති තැනැත්තකු නම් ඔහු සිරිතක් ලෙස පදිංචිව සිටින රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ ප්‍රමාදයකින් තොරව සන්නිවේදන කටයුතු කිරීමට එම තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය;
- එම රාජ්‍යයේ නියෝජිතයකුට එම තැනැත්තා හමුවීමට පැමිණීමට හිමිකම් තිබිය යුතු ය;
- එම තැනැත්තාගේ අයිතිවාසිකම් පිළිබඳව එම තැනැත්තාට දැනුම් දිය යුතු ය.

**මෙම අයිතීන් බලාත්මක කරගත හැක්කේ කෙසේද? [20 වගන්තිය]**

20(1) ප්‍රතිපාදන අනුව යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ විධිවිධාන සලසා ඇති යම් අධිකරණමය හෝ වෙනත් ප්‍රතිකර්මයකට අගති විරහිතව, මේ පනතේ 7, 14, 15, 16 හෝ 19 යන වගන්තිවල විධිවිධාන බලාත්මක කරන ලෙස ඉල්ලා සිටිමින් මහාධිකරණය අමතන පෙත්සමක් මගින් ඉල්ලීමක් කිරීමට සහ එම පෙත්සමේ අයැද ඇති පරිදි සහන හෝ පිළියම් ඉල්ලා සිටීමට නීත්‍යානුකූල අයිතිවාසිකමක් ඇති තැනැත්තකුට හිමිකම් තිබිය යුතු ය.

විධිවිධාන බලාත්මක නොකිරීම පිළිබඳව දැන ගැනීමට ලැබුන දින සිට මාස තුනක් ඇතුළත නීත්‍යනුකූල අයිතියක් ඇති යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි එම තැනැත්තා විසින් ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් පැමිණිල්ලක් ගොනු කළහැකි ය.

මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමකට අදාළ නඩු කටයුතුවල කවර හෝ අවස්ථාවක දී මහාධිකරණය විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවක දී මහාධිකරණය විසින් එම කරුණු විභාග කර වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කළහැකි අතර, තත් කාර්ය සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ මහාධිකරණය වෙත එම වාර්තාව ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය යුතු ය.

මහාධිකරණය විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට, එම ආඥාව ප්‍රකාශයට පත් කළ දින සිට සති හයක් ඇතුළත එම ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට දඬුවම් කවරේද?**

යම් තැනැත්තෙක් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට මහාධිකරණය විසින් අධිචෝදනා මත නඩු විභාග කිරීමෙන් පසු වරදකරු කරනු ලැබීමේ දී පහත සඳහන් දඬුවම්වලට යටත් කළ යුතුය.

- අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට
- රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට

වින්දිතයෙකුට රුපියල් ලක්ෂ පහකට අඩු නොවන වන්දි මුදලක් ගෙවීමට ද එම තැනැත්තා යටත් විය යුතු ය. ***[3(1),(2),(3) වගන්ති]***

## පනත් කෙටුම්පතින් උද්දර්පණය සඳහා සිදු කරන බලපෑම

*උද්දර්පණයට අදාළ ශ්‍රී ලංකාවේ නෛතික රාමුව කුමක්ද?*

1977 අංක 08 දරන උද්දර්පණ පනත (උද්දර්පණ නීතිය ) උද්දර්පණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවත්නා නෛතික රාමුව පිළිබඳව දක්වයි. මෙකී පනතේ ප්‍රතිපාදන පහත අවස්ථාවන් වලදී අදාළ වේ.

- අමාත්‍යවරයා විසින් ගැසට් කරනු ලබන නියෝගයක් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් මත බන්ධනීය වේ.
- ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් උද්දර්පණය පිළිබඳව වෙන යම් ඕනෑම රටක් සමඟ ගිවිසුමකට එළඹ ඇති විට හා අමාත්‍යවරයා විසින් මෙකී පනතේ ප්‍රතිපාදන එකී රටට අදාළ වන බවට ගැසට් පත්‍රයක් හරහා නියෝග කර ඇති විටක.

*මෙකී පනත් කෙටුම්පත හරහා උද්දර්පණ නීතිය කෙරෙහි ඇති කරන බලපෑම කවරේද?*

මෙකී පනත් කෙටුම්පත මඟින් උද්දර්පණ නීතියට ප්‍රධාන වෙනස්කම් 3ක් කරනු ලබයි;

<u>පළමුව</u>
11 වගන්තිය ප්‍රකාරව ICPPED සම්මුතිය ශ්‍රී ලංකාව හා වෙනත් ඕනෑම සම්මුතික රාජ්‍යක් අතර උද්දර්පණ එකඟතාවයක් ඇති කරන බවට සැළකිය හැකිය.

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සම්මුතියට පාර්ශවකරුවන් වන රාජ්‍ය සහතික කරනු ලැබිය යුතු ය. මෙම වගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබූ යම් රාජ්‍යයක් මින් මතු "සම්මුති රාජ්‍යයක්" වශයෙන් හඳුන්වනු ලැබිය යුතු ය. *[2 වගන්තිය]*

<u>දෙවනුව</u>
පනත් කෙටුම්පතේ ප්‍රතිඵලයක් ලෙස පහත අවස්ථාවන් වලදී ශ්‍රී ලංකාවට හා ශ්‍රී ලංකාවෙන් පිටතට උද්දර්පණය කළ හැකිය;

- ශ්‍රී ලංකාව හා වෙනත් සම්මුතික රාජ්‍යක් අතර දැනට පවත්නා උද්දර්පණ එකඟතාවයක් නොපැවතියද මෙහි දක්වන ඕනෑම සම්මුතික රාජ්‍යක් සමඟ.
- ඕනෑම පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යක් සමඟ නීතිය මඟින් එරට කෙසේ විස්තර කළද පනත් කෙටුම්පතේ දක්වා ඇති වරදක වපසරියට එවැනි රාජ්‍යක් හඳුනා ගන්න වරදක් අදාළ වන විටක. ***[10,11,12 වගන්ති]***

<u>තෙවනුව</u>
මෙකී පනත් කෙටුම්පතේ සඳහන් වරදක් කිරීම සම්බන්ධයෙන් උද්දර්පණය සඳහා ඉල්ලීමක් කර ඇති විට එය දේශපාලන ස්වභාවයේ වරදක් ලෙස හෝ දේශපාලන වරදක් හා සම්බන්ධ වී ඇති වරදක් ලෙස හෝ දේශපාලන අරමුණු අනුව සිදුකරන ලද වරදක් ලෙස දක්වා උද්දර්පණය කිරීම ප්‍රතික්ෂේප කිරීමට නොහැකිය. *[13 වගන්තිය]*